සීමාසහිත ලංකා සළුසල සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023/2024

සීමාසහිත ලංකා සළුසල සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වය සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයේ 6.6 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු සමාගමේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද 2010/2011 මූල්‍ය වර්ෂයේ සිට 2023/2024 මූල්‍ය වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්

සමාගම් විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2010 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වත්කම්	**වටිනාකම (රු.)**
ජංගම නොවන වත්කම්	25,872,950
ජංගම වත්කම්	249,749,110
මුළු වත්කම්	275, 622,060

බැරකම් හා ස්කන්ධය	
ජංගම බැරකම්	600,227,603
ජංගම නොවන බැරකම්	42,756,078
ප්‍රාග්ධනය හා සංචිත	(367,361,621)
මුළු බැරකම් සහ ස්කන්ධය	275,622,060
මුළු ආදායම්	231,205,038
මුළු වියදම	(150,993,210)
වර්ෂයේ ලාභය	80,211,828

3. විගණන නිරීක්ෂණ

3.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2010 මාර්තු 31 දිනට සමාගමේ පැවති මුළු වත්කම් මෙන් දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් බැරකම් පැවති අතර ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් ප්‍රමාණය රු.350,478,493 ක් විය. ඒ අනුව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම තර්ජනයකට ලක්වී තිබුණද කළමනාකරණය ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගමේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය.
(ආ) සමාගම විසින් අවසන් වරට විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ දී ඉඩම් දේපළ විකිණීමෙන් ලැබූ රු.83,633,328 ක ලාභයද සමඟ රු.80,211,829 ක ලාභයක් ලබා තිබුණි. එසේ වුවද 2010 මාර්තු 31 දිනට කාරක ප්‍රාග්ධනය රු.350,478,493 ක සෘණ අගයක් ගෙන තිබුණි. ඒ අනුව සමාගම් පනතේ 220 වගන්තිය අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගමේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කළ යුතුය.

3.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මැහුම් අංශයට ලැබෙන ඇණවුම් හා නිමකරන ලද ඇණවුම් සම්බන්ධයෙන් වූ වාර්තා, තොග ලැබීම් හා නිකුත් කිරීම් වාර්තා කරන තොග ලේඛන, දීර්ඝ කාලයක සිට යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	තොග ලැබීම් හා නිකුත් කිරීම් වාර්තා කරන ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.
(ආ)	සමස්ත තොග මිලදී ගැනුම් සහ විකුණුම් සම්බන්ධ ලේඛන, ණයගැති හා ණයහිමි ලේඛන, ඉන්වෙන්ට්‍රි පොත්, බදු කුලී ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය ආදී ලේඛන දීර්ඝ කාලයක සිට නඩත්තු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි	තොග මිලදී ගැනීම් හා විකුණුම් සම්බන්ධ ලේඛන, ණයගැති, ණයහිමි ලේඛන ආදීයත් අවශ්‍ය අනෙකුත් ලේඛනත් විධිමත්ව නඩත්තු කළ යුතුය.
(ඇ)	මුදල් පොත්, ලෙජර ගිණුම් සහ බැංකු සැසඳුම් වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ අතර 2024 අප්‍රේල් සිට අදාළ සියලු ගනුදෙනු මූල්‍ය තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති බව තහවුරු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි	සියළු ගනුදෙනු මූල්‍ය තොරතුරු පද්ධතියට ඇතුළත් කළ යුතුය. විගණනය සඳහා අවශ්‍යවන පොත්පත් හා වාර්තා නොපමාව ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	බදු පදනමට ලබා ගෙන තිබු අම්පාර, අනුරාධපුරය, අඟුණකොලපැලැස්ස, ගොතටුව හා බදුල්ල ප්‍රදේශවල පවතින ඉඩම් සහ ගොඩනැගිලිවලට අදාළව සමාගම විසින් ගෙවිය යුතු හිඟ බදු කුලිය සහ වරිපනම් මුදල් කොපමණ ද යන්න හඳුනාගැනිමට අදාළ ලේඛන නඩත්තු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි	හිඟ බදු කුලී නිවැරදිව හඳුනාගත හැකි පරිදි ලේඛන නඩත්තු කළ යුතුය

3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 07 දරන සමාගම් පනත			
	(i) 131 (1) වගන්තිය	සමාගම විසින් 2014 සිට වසර 10 ක් වාර්ෂික වාර්තා (ආකෘති අංක 15) සමාගම් රෙජිස්ට්‍රාර් වෙත භාරදීම පැහැර හැර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගම් පනත අනුව වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතුය.
	(ii) 170 (1) වගන්තිය	2004 වර්ෂයේ සිට එනම්, අඛණ්ඩව වසර 20 ක් විගණන වාර්තාවද සමගින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා භාර දී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගම් පනතේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන ලියාපදිංචිය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතුය.
(ආ)	2002 අංක 14 දරන එකතුකල අගය මත බදු පනතේ 21 වගන්තිය	සමාගමේ විකුණුම් වලට අදාලව 2023/2024 ගිණුම් වර්ෂය තුල අයකල රු. 776,867 ක් හා ඉකුත් වර්ෂවලට අදාලව අයකළ එකතුකල අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අයකල බදු මුදල් ප්‍රමාදයකින් තොරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ)	එක් අවස්ථාවකදී නිලධාරියෙකුට ලබා දියහැකි උපරිම අත්තිකාරම් සීමාව රු.100,000 ක් වුවත් රු. 115,632 සිට රු. 701,091 දක්වා අත්තිකාරම් ලබා දී තිබූ අවස්ථා 11 ක් නිරීක්ෂණය වූ අතර නිකුත් කර තිබූ තත්කාර්ය අතුරු අග්‍රිම, අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ඒවායේ එකතුව අතැති මුදල් ලෙස මුදල් පොතේ දක්වා තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	උපරිම සීමාව නොඉක්මවන පරිදි අත්තිකාරම් ලබාදීමටත් නිවැරදිව ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය.

(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද			
	(i) රජයට අයත් ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 හා 2.4 වගන්ති	2023/2024 වර්ෂය සඳහා උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව පිළියෙළ කර අනුමත කරගෙන නොතිබූ අතර සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් ලබා දිය යුතු ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂිකව ලබා දී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වාර්ෂිකව පිළියෙළකර අනුමතකර ගැනීමට කටයුතු කළ යුතුය. අධ්‍යක්ෂවරුන් ලබාදිය යුතු ප්‍රකාශයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) රජයට අයත් ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත			
	(1) 6.1 වගන්තිය	2023 ඔක්තෝබර් 30 දින සිට 2024 සැප්තැම්බර් දක්වා වර්ෂයකට ආසන්න කාලයක් මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ගණකාධිකාරීවරයෙකුගේ සමීප අධීක්ෂණයක් සිදු නොවීම හේතුවෙන් නිවැරදි හා යාවත්කාලීන මූල්‍ය තොරතුරු වාර්තා වී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් හා පාලනයක් ඇති කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.
	(2) 6.7 වගන්තිය	දීර්ඝ කාලයක සිට ගබඩාවේ සහ මැහුම් අංශයේ වාර්ෂික තොග හා ස්ථාවර වත්කම් සත්‍යාපනය කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	වාර්ෂිකව ස්ථාවර වත්කම් හා තොග සත්‍යාපනය කළ යුතුය.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය	2023/2024 වර්ෂයේ Credit/Debit Card මගින් සිදු කරන ලද	අදහස් දක්වා නොතිබුණි.	සමාගම නමින් බැංකුවට සිදු

මුදල් චක්‍රලේඛයේ II කොටසෙහි 1.1.2 ඡේදයට අදාළව නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි 3.1 වගන්තිය	රු.1,281,229 ක විකුණුම් වෙනුවෙන් රු.839,615 ක් පමණක් බැංකු ගිණුමට බැරවී තිබුණි. තවද එම ජංගම ගිණුමට සිදු කර තිබූ සෘජු හර කිරීම් රු.109,322 ක් හඳුනාගෙන නොතිබුණි.		කරන හර හා බැර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. හර හා බැරපත් ගනුදෙනු නිවැරදිව බැංකු ගිණුම්වලට අයවන බවට තහවුරු කරගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2013 ඔක්තෝබර් 25 දිනැති අංක අමප/13/1459/553/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජයේ තක්සේරු වටිනාකම රු.මිලියන 100 ක් වූ රත්මලානේ තෙලවල පාරේ පිහිටි සමාගම සතු අක්කර 01 රූඩ් 03 පර්චස් 34 ක සමාගම සතු ඉඩම නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත එම වර්ෂයේදීම භාරදී තිබුණද, නීත්‍යානුකූලව පැවරීම් කර නොතිබූ අතර වත්කම වෙනුවෙන් මුදල් ද ලැබී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ඉඩම් අයිතිය නීත්‍යානුකූලව පවරා ලැබිය යුතු අයවීම් අයකරගෙන ගනුදෙනු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මුල්ලේරියාවේ පිහිටි ගොඩනැගිලි දෙකෙන් එක් ගොඩනැගිල්ලක් 2007 ජනවාරි 15 සිට 2022 ජනවාරි 14 දක්වා පුද්ගලික ආයතනයකට බදු දී තිබූ අතර ආරම්භයේදී මාසිකව රු. 80,000 ක් ද 2022 ජනවාරි දක්වා මාසිකව රු. 117,128 ක් ද බදු කුලී අයකර තිබුණි. බදු කාලය අවසන් වී මාස නවයකට පසු 2022 ඔක්තෝබර් 24 දින සිට මාසිකව රු. 65,000 බැගින් වසර 05 ක් සඳහා නැවත බදු දී තිබුණ ද, බදු කුලිය ඉකුත් ගිවිසුමට වඩා අඩු කිරීමට හේතු අනාවරණය නොවූ අතර බදු තක්සේරු වාර්තාවක් ද ලබා ගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	එළඹ ඇති බදු ගිවිසුම අවලංගු කර නැවත ගිවිසුම් ගත වීමට පියවර ගත යුතුය. ගොඩනැගිල්ල තක්සේරුකර බදු ගිවිසුමට එළඹිය යුතුය. වසර 5 ක් වැනි දීර්ඝ කාලීන ගිවිසුමකට එළඹීමට කටයුතු කිරිමෙන් ද අලාභ සිදුවන බැවින් මෙම තීරණය අනුමත කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගත යුතුය.

(ඇ)	සමාගම සතු උණවටුනේ පිහිටි ගොඩනැගිලි සහිත අක්කර 01 පර්චස් 30.6 ක ඉඩමක් ලක්සල වෙත පැවරීමට 2012 ඔක්තෝබර් 11 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබූ අතර, 2009 වර්ෂයේදී එහි අවම මිල රු.මිලියන 16 ක් ලෙස තක්සේරු කර තිබුණි. ලක්සල විසින් ඒ වෙනුවෙන් රු.15,248,575 ක මුදලක් 2012 වර්ෂයේදී ගෙවා තිබුණ ද, 2023 වර්ෂය අවසන් වනවිටත් දේපල පවරා දී නොතිබුණි. එසේ තිබියදී නව තක්සේරුවකින් තොරව 2023 වර්ෂයේදී සමාගම විසින් එම දේපල රු.මිලියන 25කට කාර්මික සංවර්ධන මණ්ඩලයට විකුණා ලද මුදල් ස්ථාවර තැන්පතු දෙකක මාස 03ක කාලයක් සඳහා තැන්පත් කර තිබුණි. ඉන් රු.10,000,000 ක ස්ථාවර තැන්පතුවක් කල්පිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින්ද තොරව ආපසු ලබා ගෙන තිබූ අතර ඉන් රු.5,000,000 ක් වැටුප් ගෙවීමට සහ රෙදි මිලදී ගැනීම් ආදි කටයුතු වෙනුවෙන් වියදම් කර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	රජයේ ඉඩම් විකිණීමට පෙර තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. බාහිර පාර්ශව වෙත ගෙවිය යුතු මුදල් ගෙවා නිරවුල් කිරීමටත් ස්ථාවර තැන්පතු මුදල් කර ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	ගලගෙදර අක්කර 01 රූඩ් 01 පර්චස් 39.5 කින් යුතු ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි 03 ක් සහිත නිෂ්පාදන ආයතනය මධ්‍යම පළාත් සභාවේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ එක්ව සමූහ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට 2022 අගෝස්තු 11 දින ගිවිසුමකට එළඹ තිබුණ ද 2024 මාර්තු 31 වන විටත්, එම ගිවිසුම පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ගිවිසුම්ගත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපයීම හා වත්කම් ඵලදායී ලෙස උපයෝජනයට කටයුතු කළ යුතුය.
(ඉ)	රත්නපුර පිහිටි සමාගම සතු ගොඩනැගිල්ල රාජ්‍ය සංස්ථා දෙකකට බදු දී තිබුණද, බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවූ අතර බදුකුලී නියමිත පරිදි අය කරන බවට ලේඛන අනුව තහවුරු කරගත නොහැකි විය.	අදහස් දක්වා නොතිබුණි.	බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර බදු කුලී අයකරගැනීම් පිළිබඳ ලේඛන විධිමත්ව පවත්වා ගත යුතුය.
(ඊ)	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් රු. මිලියන 6 කට 1991 වර්ෂයේදී මිලදීගෙන තිබූ පෙහෙකම්හල් 5 න් මීගොඩ පිහිටි රූඩ් 03 පර්චස් 9.4 ක ගොඩනැගිලි සහිත ඉඩමේ සහ කළුතර නාගොඩ පිහිටි අක්කර 1 රූඩ් 2 පර්චස් 33.5 ක් වූ ඉඩමේ අයිතිය සමාගමට පවරාගෙන නොතිබුණි. එම දේපලෙහි හිමිකාරිත්වය තහවුරු කර ගැනීමට සමාගම කටයුතු නොකිරීම හේතුවෙන් පසුව එම දේපල පිළිවෙළින් අධ්‍යාපන අමාත්‍යාංශයට සහ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට පවරා තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගම සතු ඉඩම් හා දේපල නිසි පරිදි පවරා ගෙන හිමිකාරීත්වය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.

(උ)	තලංගම පිහිටි බලවේග පෙහෙකම්හල් ගොඩනැගිල්ල වෙනුවෙන් එළඹ තිබූ බදු ගිවිසුම 2016 ජුනි 07 දිනෙන් අවසන් වී තිබුණද නැවත ගිවිසුම් ගත නොවීම හේතුවෙන් වසර 8 කට වැඩි කලක සිට බදු ගිවිසුමකින් තොරව ගොඩනැගිල්ල එම ආයතනය විසින්ම භාවිතා කරමින් පැවතුනි. මීට අදාල බදුකලී ලැබීම් නිවැරදිව වාර්තා කර නොමැති වීමෙන් හිඟ බදු මුදල් කොපමණද යන්න හඳුනා ගැනීමට ද නොහැකි විය. තවද මෙම දේපළට සම්බන්ධ සියලු ලිපි ලේඛන ඇතුළත් ගොනුව 2022 නොවැම්බර් 17 දින හිටපු ගණකාධිකාරී විසින් රැගෙන ගොස් තිබුණ ද ඒ සම්බන්ධයෙන් සමාගම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	නියමිත කාලය තුළ බදු ගිවිසුම් අලුත් කිරිමටත් නියමිත පරිදි බදු කුලි අය කර ගිණුම් තැබීමටත් කටයුතු කළ යුතුය. ලිපි ගොනුව රැගෙනයාම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වැරදිකරුවන්ට විනයානුකූලව දඬුවම් කළ යුතුය.
(ඌ)	ගොතටුවේ පිහිටි රූඩ් 01 පර්චස් 18 ක බදු ඉඩමක් 1975 ජනවාරි 01 දින සිට වසර 50 ක කාලයක් සඳහා ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය සහිතව සළුසල සමාගම විසින් අතුරු බදු ගෙන තිබුණි. එම අතුරු බදු ලබා ගත් ඉඩමේ අයිතිය සමාගමට පැවරී නොතිබුණද ගොඩනැගිලි ඉදිකිරීමට ද සමාගම වියදම් දරා තිබුණි. පසුව ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පෞද්ගලික ආයතනයකට පරිශ්‍රය නැවතත් අතුරු බදු දී තිබුණි. එම ආයතනය 2011 වර්ෂයෙන් පසු බදු මුදල් ගෙවා නොතිබූ අතර ඉඩමේ බදු අයිතිය වෙනස් කර තිබේද යන්න තහවුරු කර ගෙන හිඟ බදු මුදල් හෝ ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල් අයකර ගැනීමට වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	බදු ගිවිසුම් වලට අනුකූලව කටයුතු කළ යුතුය. බදු අයිතිය නිරවුල් කර ගැනීමට හා හිඟ බදු මුදල් අයකර ගැනීමටත් ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් අනුව නියමිත පාර්ශව වෙතින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඍ)	සමාගම සතු අම්පාරේ පිහිටි ගොඩනැගිල්ලක් තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව 2023 පෙබරවාරි 16 සිට 2033 පෙබරවාරි 15 දක්වා පුද්ගලික ආයතනයකට රු. 60,000 බැගින් වූ මාසික කුලියකට බදු දී තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	බදු ගිවිසුම් වලට එළඹීමේදී දේපල තක්සේරු වාර්තා ලබාගත යුතුය.
(ඎ)	මහවැලි අධිකාරිය සතු අගුණකොළපැලැස්සේ රූඩ් 01 ක ඉඩම හා දෙමහල් ගොඩනැගිල්ල ප්‍රදර්ශනාගාරයක් සඳහා බදු පදනමට ලබාගෙන තිබුණද විගණිත දිනය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය.

(එ)	බදුල්ලේ පර්චස් 18.5 ක බදු ඉඩමක පිහිටි ගොඩනැගිලි 02ක් සංස්කෘතික අමාත්‍යාංශයට පවරා තිබුණ ද ඒ බව තහවුරු කිරීමට ලේඛන ඉදිරිපත් නොකෙරුණි.	අදහස් දක්වා නොතිබුණි.	ඉඩම් වල අයිතිය හා පැවරීම් වලට අදාල ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඒ)	1974 ජුනි 19 දින බදු පදනම මත ඉඩම් කොමසාරිස් විසින් ලබා දී ඇති කුරුණෑගල පිහිටි ඉඩම ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව 2022 මාර්තු 15 සිට 2034 මාර්තු 15 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රජයේ තක්සේරුවකින් තොරව හවුල් වෙළඳ ව්‍යාපාරයක් සඳහා බදු දී තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	බදු තක්සේරුවක් මත ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන ඉඩම බදු දීමට කටයුතු කළ යුතුය.
(ක)	සළුසල සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය සඳහා වූ 2015 වර්ෂය දක්වා වූ රු.මිලියන 323 ක හිඟ බදු කුලියක් ගෙවා නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	හිඟ බදු කුලී නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ග)	අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු ජාවත්ත පරිශ්‍රයේ වූ ගබඩාවක් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියකින් තොරව සමාගම විසින් මාසිකව රු.50,000 ක බදු කුලියකට 2024 ජූලි 31 දින සිට තෙවන පාර්ශවයකට බදු දී තිබූ අතර බදු දීමේ දී ගොඩනැගිලි කුලිය තක්සේරු කිරීම හා තරඟකාරී මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව රු. 150,000 ක් වූ මාස 03 ක කුලියක් ආරක්ෂිත ඇප මුදලක් ලෙස දින රහිත චෙක්පතකින් ලබාගෙන තිබුණි. තවද අදාල ගබඩාව බදු ගැනුම්කරුට භාරදෙන අවස්ථාවේදී ගබඩාවේ පැවති රෙදි තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	අදහස් දක්වා නොතිබුණි.	ගොඩනැඟිලි බදු දීමේදී තක්සේරු කර මිල ගණන් කැඳවා බදු දීමට කටයුතු කළ යුතුය. ගබඩාවේ පැවති රෙදි තොග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. ආරක්ෂිත ඇපය මුදලින් හෝ බැඳුම්කරයක් ලෙස ලබාගත යුතුය.
(ච)	23/2024 වර්ෂය වනවිට සමාගම සතු සහ බදු පදනම මත ලබා ගෙන තිබූ අලෙවිසැල් 11 අතුරෙන් ජාවත්ත හා නුගේගොඩ පිහිටි අලෙවිසැල් පමණක් ක්‍රියාත්මක තත්වයේ පැවති අතර අලෙවිසැල් 5 ක් බදු දී තිබුණි. වෙනත් අමාත්‍යාංශවලට නිදහස් කිරීම් 1 ක්ද වසා දැමීම් 1ක් ද වූ අතර 2ක් විකුණා දමා තිබුණි. සමාගම සතු නිෂ්පාදන කර්මාන්ත ශාලා 2ක් වසා දමා සහ 2 ක් විකුණා තිබූ අතර වෙනත් අමාත්‍යාංශවලට නිදහස් කිරීම් 2 ක්ද මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සමග එකාබද්ධ කර ඇති කරගත් සමූහ ව්‍යාපෘති 1ක් ද වූ අතර කර්මාන්ත ශාලා 4 ක් බදු දී තිබුණි. බදු දුන් කර්මාන්ත ශාලාවලින් කර්මාන්ත ශාලා 2 ක බදුකුලී ගෙවීම් පැහැර හැර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගමේ ක්‍රියාත්මක අලෙවිසැල් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කර ගැනීමට පියවර ගත යුතුය.

(ජ) සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් අදහස් දක්වා
ගෙවිය යුතු බදු කුලී රු. මිලියන 362 ක් ගෙවා නොතිබුණි.
නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ වියදමින් 2024 මාර්තු මාසයේදී මසා නිමකල කමිස 879 ක් සළුසල සන්නාමයෙන් නොසපයා, කමිස මැසූ ආයතනයේ සන්නාම දෙකකින් සපයා තිබුණි. එයින් කමිස 652 ක් 2024 අගෝස්තු වන විටද ප්‍රදර්ශනාගාරවල පැවති අතර ඇතැම් කමිස අලෙවි කිරීමට සුදුසු ගුණත්වයෙන් නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	අදහස් දක්වා නොතිබුණි.	සමාගමේ සන්නාමයෙන් යුතුව ගුණාත්වයෙන් යුත් නිෂ්පාදන මගින් අලෙවිය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023/24 වර්ෂයේදී ස්ථාන 13 කදී පවත්වන ලද ජංගම වෙළඳ කුටිවලින් රු.903,309 ක විකුණුම් සිදු කර තිබුණි. එම අලෙවිය සඳහා රැගෙන යන තොග සහ ඉතිරි තොග පිළිබඳ වාර්තා තබාගෙන නොතිබූ අතර, අවස්ථා තුනක් සම්බන්ධයෙන් සිදුකරන ලද නියදි පරීක්ෂාව අනුව එකතුව රු.284,510 ක් වූ විකුණුම්වලට අදාල වියදම රු.441,645 ක් වී තිබූ බැවින් විකුණුම් වලින් ලාභ ලැබී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	විකුණුම් සිදු කිරීමේදී පිරිවැය ආවරණය කර ලාභ ලැබිය හැකි පරිදි සිදුකළ යුතුය.
(ඇ)	2022/23 වර්ෂයේ ඇණවුම් සැපයීම තුළින් වූ විකුණුම් රු.20,974,725 ක් වුවද 2023/24 වර්ෂයේ ඇණවුම් 31 ක් තුළින් රු.6,178,791 ක විකුණුම් පමණක් සිදු කර තිබුණි. ඒ අනුව තොග අලෙවි ආදායමේ සියයට 70 ක පහත බැසීමක් පෙන්නුම් කර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අලවිකරණ උපක්‍රම තුළින් අලෙවි ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	දෙපාර්තමේන්තුවකින් වසර කිහිපයක සිට ලද ඇණවුම්වලට අදාළව මිලදීගත් රෙදිවලින් ඉතිරි වූ රෙදි කැබලි තොග එකතුව අවස්ථා දෙකකදී මීටර් 2800 ක් හා මීටර් 3,244 ක මීටරයක් පිළිවෙලින් රු.225 කට හා රු.160 කට විකුණා තිබුණි. පළමු අවස්ථාවේදීම විකිණීමට ඇති රෙදි තොගය නිවැරදිව හඳුනා නොගැනීම නිසා දෙවන වර විකුණුම් මිල පළමු අලවියට වඩා මීටරයකට රු. 65 ක් අඩුවීමෙන්	අදහස් දක්වා නොතිබුණි.	විකුණුම් මනා කළමනාකරණයකින් යුතුව සිදු කළ යුතුය.

	රු. 210,885 ක පාඩුවක් සිදුව තිබුණි. තවද දෙවන වර විකුණුම වෙනුවෙන් අවස්ථා දෙකකදී ටෙන්ඩර් දැන්වීම් පළකිරීම වෙනුවෙන් රු.98,244 ක්ද වැය කිරීම නිසා එකතුව රු 309,129 ක අලාභ සිදු වී තිබුණි.		
(ඉ)	සමාගමේ ප්‍රධාන අලෙවි ප්‍රදර්ශනාගාර දෙක ජාවත්ත සහ නුගේගොඩ පිහිටුවා තිබූ අතර පාරිභෝගික ආකර්ෂණය ලබාගත හැකි නවීන මෝස්තර ප්‍රදර්ශනය කිරීම හා පවතින රෙදිපිළි ප්‍රදර්ශනාගාර දෙක අතර හෝ හුවමාරු කිරීම තුලින් ප්‍රදර්ශනාගාරයන්හි නැවුම් බව ඇති කිරීමට අවශ්‍ය උපායමාර්ග නොගැනීමෙන් එකම මෝස්තරයේ රෙදිපිළි වර්ෂ ගණනාවක් ප්‍රදර්ශනාගාර තුළ පැවතීම හේතුවෙන් ගනුදෙනුකරුවන්ගේ ආකර්ෂණය අඩු වී තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අලෙවිකරණ ශිල්ප ක්‍රම භාවිතා කර අලෙවි ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ප්‍රදර්ශනාගාර භාරකරුවන් විසින් ඇණවුම් කරනු ලබන රෙදිපිළි ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රදර්ශනාගාර වෙත නොලැබීමත්, නව රෙදිපිළි මිලදීගැනීම අඩුවීමත්, උත්සව සමයේ ප්‍රදර්ශනාගාර විවෘත කිරීමේ දින සහ පැය ගණන වැඩිකිරීම කෙරෙහි අවධානය යොමු නොවීමත් ප්‍රදර්ශනාගාරවල වෙළඳාම අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අලෙවිය වැඩිකර ගැනීමට තරඟකාරි උපායමාර්ග අනුගමනය සඳහා යොමු විය යුතුය.
(උ)	මාර්ගගත විකුණුම් ප්‍රවර්ධනය වෙනුවෙන් 2022/23 වර්ෂයේ රු.217,617 ක වියදමක් දරා ඇතත් මේ දක්වා මාර්ගගත විකුණුම් සිදු කිරීම ආරම්භ කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	-එම-

4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුල්ලේරියාවේ පිහිටි වර්ග අඩි 3,750 ක් පමණ වූ ගොඩනැගිල්ලක් 2003 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබූ අතර 2022 ඔක්තෝබර් 14 දින පුද්ගලික සමාගමකට බදු දී තිබුණි. කෙසේ වුවද 2024 සැප්තැම්බර් වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කළ යුතුය.

(ආ)	බේරුවල ප්‍රධාන මාර්ගයට යාබදව පවතින වර්ග අඩි 8,258.4 ක ගොඩනැගිල්ල සහිත රූඩ් 1 පර්චස් 16 ක ඉඩම වසර 15 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	-එම-
(ඇ)	සමාගමේ මැහුම් සහ තිර රෙදි අංශය සතුව පවතින මහන මැෂින් 74 කින් මැෂින් 54 ක් අක්‍රීය තත්වයේ පවතින අතර 2022/23 වර්ෂයේදී රු.194,410 ක් වැය කර මැෂින් 20ක් අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවද ඒවා නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතා කිරීමට වැඩපිළිවෙලක් සකස් නොකිරීමෙන් නිෂ්කාර්යව පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	සමාගම සතු වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා ආදායම් ඉපයීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.
(ඈ)	ස්වේච්ඡාවෙන් සේවකයන් විශ්‍රාම ගැන්වීම යටතේ 2016 වර්ෂයේදී වන්දි හා පාරිතෝෂික ගෙවීමේදී වැරදියට අඩුකරගත් මුදල නැවත ගෙවන ලෙස ඉල්ලා එම ක්‍රමය යටතේ විශ්‍රාම ගත් සේවකයෙකු බේරුම්කරණ අංශ සහ කාර්මික අධිකරණයේ නඩු පවරා තිබුණි. 2023/24 වර්ෂයේදී එම නඩුවේ තීන්දුව අනුව එසේ අඩුකරගත් රු.219,137 ක මුදල නැවත ගෙවීමට සමාගමට සිදුවී තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	වන්දි හා පාරිතෝෂිත වැරදි ආකාරයට ගණනය කිරීමට හා ගෙවීමට වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු අතර අලාභය අයකර ගත යුතුය.